# විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

# 2022.02.25

# පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

## පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2022.02.25 වන දින පැවති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව.

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ විශේෂ මහා සභා රැස්වීම 2022 පෙබරවාරි මස 25 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු උපසභාපති | - | ඩී.වී.උපාලි මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.ආරියරත්න මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.ඉන්දික මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සූරවීර මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සෙල්වනායගම් රගවන් මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින විශේෂ මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපතිතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

### 01. යථා පරිදි කල් දී ඇති යෝජනා.

#### I . ගරු සභාපති ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.

**1.** 2021 වර්ෂයට අදාළව සකස් කරන ලද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ අවසාන ගිණුම් ප්‍රකාශනය හා එයට අදාළ කාර්ය සාධන වාර්තාව සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උපසභාපති ඩී.වී.උපාලි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

සෑම මසකම මහා සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා ආදායම් , වියදම් වාර්තා හා ලැබීමට ඇති ආදායම් , ගෙවීමට ඇති වියදම් ඇතුලත්ව අවසාන ගිණුම සකස් කරන බවත් , 2021 වර්ෂයට අදාළව සකස් කරන ලද අවසාන ගිණුම් ප්‍රකාශනය හා එයට අදාළ කාර්ය සාධන වාර්තාව පෙබරවාරි මස 28 වන විට පළාත් සභාවට යොමු කළ යුතු බවත් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමාගේ අදහස් වලට පක්ෂ වෙමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ මෙය මහා සභාවට නුහුරු අත්දැකීමක් බවත් , අවුරුදු කිහිපයක සිට මෙසේ විශේෂ සභාවක් මගින් අවසාන ගිණුම් ප්‍රකාශනය හා කාර්යය සාධන වාර්තාව ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා බවත් ය.

**<u>තීරණ අංක 01 - i</u>**

2021 වර්ෂයට අදාළව සකස් කරන ලද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ අවසාන ගිණුම් ප්‍රකාශනය සඳහා අනුමැතිය ලබා දීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 01 – ii</u>**

2021 වර්ෂයට අදාළව සකස් කරන ලද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ අවසාන ගිණුම් ප්‍රකාශනය සඳහා අදාළ කාර්ය සාධන වාර්තාවට අනුමැතිය ලබා දීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වෙනත් කරුණු**

- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වය හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ,

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා.
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා.
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමා.
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා.
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා.
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා.
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා.
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා.
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.පියසේන මැතිතුමා.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා.
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා.

හට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු උපසභාපති ඩී.වී.උපාලි මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- **සභාපතිතුමාගේ ස්තුති කථාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු උප සභාපති තුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත්, ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටත් ස්තුතිය පුද කරමින් සිය ස්තුති කථාව අවසන් කරන ලදී.

**පෙ.ව.11.00 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.**

2022.02.28 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ දීය.

ලේකම්
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා ........................................................................ මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ........................................................................ මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2022-03-10 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව